# මුදල් අමාත්‍යාංශය
# நிதி அமைச்சு
# MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01, இலங்கை.
The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: (94)-011-2484500, (94)-011-2484600, (94)-011-2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: (94)-011-2449823
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல / My No: PFD/RED/REG/02/CC/01/2021
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2021.05. 12

අමාත්‍යාංශ ලේකම්වරුන්

රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්

පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන්

දිස්ත්‍රික් ලේකම්වරුන් සහ

පළාත් පාලන ආයතන ප්‍රධානීන්

**<u>අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල වාර්ෂික කාර්යසාධන වාර්තා සහ ගිණුම්</u>**

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16 (2) වගන්තිය අනුව, ඔබ විසින් විගණකාධිපතිවරයා වෙත වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී වාර්ෂික කාර්යසාධන වාර්තාව ද ඉදිරිපත් කළ යුතු බව සඳහන් වේ. 2020.08.28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 10 ඡේදයේ සඳහන් පරිදි ඔබ ආයතනය සහ ඔබ යටතේ ඇති සියළුම ආයතන 2020.12.31 දිනෙන් අවසන් ගිණුම් වර්ෂය සඳහා වූ වාර්ෂික ගිණුම් සමඟ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16 (2) වගන්තිය අනුව වාර්ෂික කාර්යසාධන වාර්තාව ද, උක්ත චක්‍රලේඛ විධිවිධාන පරිදි රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ අංක 06 අනුව 2021.02.28 දින වනවිට විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇතැයි අදහස් කරමි.

02. ඉහත 01 ඡේදයේ සඳහන් පරිදි ඔබ ආයතනය විසින් විගණකාධිපතිවරයා වෙත අදාළ වාර්තා ඉදිරිපත් කර තිබුණ ද, රට තුළ නැවතත් පැතිර යන COVID-19 ගෝලීය වසංගත තත්ත්වය හේතුවෙන් රාජ්‍ය ආයතනවල දෛනික රාජකාරි සඳහා සීමිත නිලධාරීන් පිරිසක් කැඳවමින් රාජකාරි කටයුතුවල යෙදෙන බැවින්, රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 12 ඡේදයේ විධිවිධාන අනුව, මුදල් වර්ෂය අවසන් වී දින 150 කට පෙර 2020 වර්ෂයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා ඉදිරිපත් කිරීමට රාජ්‍ය ආයතනවලට අපහසුතාවයක් ඇති බව නිරීක්ෂණය කෙරේ. ඒ

අනුව, 2020 වර්ෂය සඳහා වන වාර්ෂික කාර්යසාධන වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමේ දිනය 2021.06.30 දින දක්වා දීර්ඝ කරන බව කාරුණිකව දන්වමි.

එස්.ආර්. ආටිගල

භාණ්ඩාගාරයේ ලේකම්

පිටපත්: 01. ජනාධිපති ලේකම්

02. අග්‍රාමාත්‍ය ලේකම්

03. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්

04. ලේකම්, රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

05. විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය

06. සභාපති, මුදල් කොමිෂන් සභාව